// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2419/35 - 2025 ජනවාරි මස 17 වැනි සිකුරාදා - 2025.01.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාත් සභාවේ 1992 අංක 01 දරන මාර්ගස්ථ මඟී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියෙහි 3(8) වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

බස්නාහිර පළාතේ මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරියෙහි කළමණාකරණ මණ්ඩලයෙහි සාමාජිකත්වය නැවත යථාවත් කර පත් කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇති හෙයින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඇ සහ 154 ඊ ව්‍යවස්ථාව හා බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1992 අංක 01 දරන මාර්ගස්ථ මඟී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියෙහි 3(8) වන වගන්තිය යටතේ බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි පහත නම් සඳහන් තැනැත්තන් බස්නාහිර පළාතේ මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරියෙහි කළමණාකරණ මණ්ඩලයෙහි සාමාජිකත්වයෙන් ඉවත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

1. ඉන්දික හපුගොඩ මහත්මා
2. මහේන්ද්‍ර වික්‍රමාරච්චි මහත්මා
3. එච්. ජී. කෝරලේආරච්චි මහත්මා
4. එච්. එච්. ලකිඳු ගජසෙන් හේරත් මහත්මා

හනීෆ් යූසුෆ්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

වර්ෂ 2024 ක් වූ දෙසැම්බර් මස 20 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 01 - 0145

1A - PG 7002 — 09 (2025/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*